www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බාටා වර්ජකයින්ට එරෙහිව ශ්‍රී ලංකා ආන්ඩුව ප්‍රබල පොලිස් මෙහෙයුමක් දියත් කරයි

## Sri Lankan government launches major police operation against Bata strikers

**සමන් ගුනදාස විසිනි**
**2004 අගෝස්තු 07**

ශ්‍රී ලංකා ආන්ඩුව පසු ගිය අඟහරුවාදා කොලඹ නගරාසන්නයේ පිහිටා ඇති බාටා කම්හල වාඩි ලා ගත් සේවයෙන් පහ කල කම්කරුවන්ට එරෙහිව මිලිටරි-ගනයේ පොලිස් මෙහෙයුමක් දියත් කලේ ය.

සේවයෙන් පහ කල වෘත්තීය සමිති නායකයා යලි සේවයේ පිහිටුවන ලෙස ද සමාගමෙහි සේවකයන් ඉවත් කිරීමේ සැලසුම ඉවත් කර ගන්නා ලෙස ද බල කරමින් මාසයකට අධික කාලයක් කම්හල වාඩි ලා සිටින 500ක් පමන නිරායුධ කම්කරුවන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ පොලිස් හමුදාවේ 400 ට අධික සංඛ්‍යාවක් යෙදවිනි.

කඳුලු ගෑස්, වතුර විදින යන්ත්‍ර හා කුලු පොලු, ගත් කැරලි මර්දන ඒකකයක් ද සමග ස්වයංක්‍රීය ගිනි අවි ගත් පොලිස් නිලධාරීන් පොලිස් ස්ථාන හතකින් බලමුලු ගන්වා තිබිනි. ගිනි නිවන හමුදා රථ දෙකක් හා ගිලන් රථ ද, ට්‍රක් රථ දෙකක් ද ඇතුලුව පොලිස් වාහන ගනනාවක් යොදවා ගැනිනි.

ප්‍රධාන ගේට්ටුව ද ඒ අසල කම්කරුවන් තනාගෙන තිබූ කූඩාරම ද බිඳ පොලිසිය කම්හල් සංකීර්නය තුලට කඩා වැදිනි. පිට නොවුන හොත් බලහත්කාරයෙන් දොට්ට ඇද දමන බවට කම්කරුවන්ට තර්ජනය කෙරිනි. කම්කරුවන් නොරිස්සුම් සහගත ලෙස පිටතට ගිය පසුව කම්හල් පරිශ්‍රය තුල පොලිස් භටයන් 50ක් පමන යෙදවිනි.

පොලිසිය එක් කම්කරුවකු අත් අඩංගුවට ගත් නමුත් පසුව නිදහස් කලේ ය. තවත් වර්ජකයින් 13 දෙනකු කම්හලෙහි දේපලවලට අලාභ හානි කිරීමේ චෝදනාව මත ගල්කිස්ස උසාවියට ගෙන්වා ඇප මත මුදා හැරිනි. සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් තොරව චෝදනා ගෙතීම පිලිබඳව කම්කරුවෝ පරිපාලනයට චෝදනා කලහ.

මෙහෙයුම සංවිධානය කෙරුනේ ආන්ඩුවේ ඉහල ම තැන් වලිනි. පොලිසිය කම්හල් පරිශ්‍රයට ඇතුල්වන විට වෘත්තීය සමිති නායකයකු අගමැති මහින්ද රාජපක්ෂට දුරකථනයෙන් ඇමතූ බව කම්කරුවෝ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසූහ. නියෝගය පැමිනියේ ඉහලින් යැයි කියමින් රාජපක්ෂ මැදිහත් වීම ප්‍රතික්ෂේප කලේ ය. අගමැති ට ඉහලින් සිටින්නේ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග හැරෙන්නට අන් කවරෙක්දැයි කම්කරුවෝ විමසූහ.

පෙර දින ගල්කිස්ස උසාවියේ මහේස්ත්‍රාත් මොහොමඩ් මැකී විසින් අපරාධ නීති සංග්‍රහයට අනුව, කම්හල වාඩි ලා ගැනීම අවසන් කිරීමට හා කම්කරුවන් අත් අඩංගුවට ගැනීමට, මිලිටරිය යොදවා ගැනීම ද ඇතුලුව, බලය යෙදීමට ඉඩ ලබා දෙමින් ඉවත් කිරීමේ නියෝගයක් දෙනු ලැබ තිබිනි. මෙම නියෝගය පදනම් වී තිබුනේ කම්කරුවන්ගේ ක්‍රියාවන් නීතිවිරෝධී අනවසර කඩාවැදීමක් ලෙස ප්‍රකාශ කරමින් නීතිපති විසින් නිකුත් කරනු ලැබූ ලිපියක් මත ය.

මහේස්ත්‍රාත් විසින් මෙම නියෝගය දෙනු ලැබුවේ ජූනි 30 දින කොලඹ දිස්ත්‍රික් උසාවිය විසින් වාඩි ලා ගැනීමට එරෙහිව නිකුත් කරනු ලැබූ නියෝගයට එරෙහිව වෘත්තීය සමිතිය ඉදිරිපත් කල අභියාචනය විභාග කිරීමට නියමිතව තිබිය දී ය. කම්කරුවන් පරිශ්‍රයෙන් ඉවත් වීම ප්‍රතික්ෂේප කර තිබූ අතර අභියාචනය අගෝස්තු 6 දින විභාග කිරීමට නියමිතව තිබිනි.

පොලිස් මෙහෙයුම සති දෙකකට අධික කාල පරිච්ඡේදයක් තුල සූදානම් කෙරෙමින් පැවැතිනි. සමාගමේ කලමනාකාර අධ්‍යක්ෂ කිම් බ්‍රැඩ්ලි ජූලි 21 දින පොලිස්පති හමු වූ අතර වාඩි ලා ගත් කම්කරුවන්ට එරෙහිව ඉක්මන් පියවර ගන්නා බව මාධ්‍යයන්ට ප්‍රකාශ කර සිටියේ ය. ‘‘සිද්ධි දාමයෙන් නීත්‍යනුකූල ප්‍රතිඵලයක් ඇති වන බව පිලිබඳව තදබල විශ්වාසයක් අප තුල ඇති අතර බාටා සමාගම ඉතාම ඉක්මනින් ව්‍යාපාරික කටයුතු යලි අරඹනු ඇතැ’’යි ඔහු කීවේ ය.

සේවයෙන් පහ කල කම්කරුවන් 146 ආන්ඩුවේ වන්දි සූත්‍රයට අනුව වන්දි ලබා ගැනීමට එකඟවන්නේ නම් කම්කරුවන් 449 යලි සේවයට ගැනීමට සමාගම සූදානම් බව මෙම රැස්වීමෙන් පසුව ප්‍රකාශයට පත් කෙරිනි. මෙම යෝජනාව ‘‘දුර්දාන්ත කම්කරුවන්ට කම්හලට යලි බැඳීමට’’ ලැබෙන අවසාන අවස්ථාව බව බ්‍රැඩ්ලි අවධාරනය කලේ ය. වර්ජකයින් යෝජනාව හෙලා දකිමින් සමාගම විසින් සේවයෙන් පහ කර ඇති 595 දෙනා සම්පූර්න වසයෙන් ම යලි සේවයේ පිහිටුවන ලෙස බල කර සිටියේ ය.

පොලිස් ක්‍රියාවට සුලු වේලාවකට පෙර බ්‍රැඩ්ලි ප්‍රශංසා මුඛයෙන් මාධ්‍යයන්ට මෙසේ ප්‍රකාශ කලේ ය: ‘‘ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික රටක් බැවින් වෘත්තීය සමිති සාමාජිකයන්ගේ ක්‍රියාව නීති විරෝධී අනවසර කඩාවැදීමකට සමාන බව පැවසෙන නීතිපති දෙපාර්තමේන්තුවේ ලිපිය හා උසාවි නියෝගය සමග

යුක්තියේ රිය සක වහා ගමනාරම්භ කරන බවට මට සැකයක් නැත. පොලීසිය ඉක්මනින් ම පැමින ගැටලු ඇති කරන්නන් ඉවත් කර දමනු ඇතැයි මම විශ්වාස කරමි.''

කෝපාවිෂ්ට කම්කරුවෝ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව ද පොලිසියේ හා උසාවියේ ''යුක්තියද'' හෙලා දුටහ.

වසර 21ක් කම්හලෙහි සේවය කල දෙදරු මවක් වූ කාන්තා කම්කරුවෙක් *ලෝසවෙඅට* මෙසේ ප්‍රකාශ කලා යඃ ''මා වැන්දඹුවක් බැවින් මගේ පවුලට ඇති එක ම ආදායම මෙම රැකියාව යි. මට මසකට ලැබෙන රුඃ8500 (ඇ.ඩො.85) දෙකොන ගැටගසා ගැනීමට යන්තමින් ප්‍රමානවත්. පසු ගිය මාසයේ අපට වැටුප් නොලැබුනු නිසා පවුල් නඩත්තු කිරීමේ දුෂ්කරතාවන්ට අපි මුහුන දී සිටිනවා.

''සේවයෙන් පහකිරීම් අවසන් කිරීමට මෙම ආන්ඩුව ක්‍රියා කරතැයි යන විශ්වාසය මත එජනිසය බලයට පත් කිරීමට මා ඡන්දය ලබා දුන්නා. නමුත් ආන්ඩුවේ ඇමතිවරයෙකු හෝ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙකු හෝ පසු ගිය දින 44ක කම්හල වාඩි ලා ගත් කාලය තුල මෙතැනට පැමින අපට කතා කලේ නෑ. (එජනිසයේ හවුල් කාර) ජනතා විමුක්ති පෙරමුන ද මේ ගැන සොයා බැලීමට පොරොන්දු වුවත් ඔවුන් ද අනෙකුත් පාලක පක්ෂවලට වඩා වෙනස් නැහැ.''

පොලිස් මෙහෙයුම බාටා සේවකයින්ට පමනක් නොව සමස්ත කම්කරු පන්තියට ම එල්ල වූවක් බව 24 වසරක් සේවය කර ඇති තිදරු පියෙකු වූ ලාල් පෙරේරා *ලෝසවෙඅට* ප්‍රකාශ කලේ ය. ප්‍රහාරය හෙලා දකින ලෙස ලංකාව පුරා සිටින කම්කරුවන්ගෙන් ඔහු ඉල්ලා සිටියේ ය. කම්කරුවන්ට එරෙහිව විකෘති කතාවක් ගොතා ගැනීමට මාධ්‍යයන්ගේ සහාය පැතූ අතර ම පොලිසිය විසින් ගිලන්රථ ගෙන එනු ලැබුවේ ප්‍රචන්ඩත්වය යොදා ගැනීමට තිබූ සූදානම නිසා බව ඔහු කියා සිටියේ ය.

''මා කම්හලේ ගිනි නිවන කන්ඩායමේ ස්වෙච්ඡා සාමාජිකයෙක්. අප කම්හලට සැලකුවේ අපේම තැනක් ලෙසට යි. දැන් මා සේවය කල අංශයේ දිනකට නිපැයූ සෙරෙප්පු 18,000, 4,000 දක්වා අඩුකර තිබෙනවා. නිෂ්පාදනය වෙනත් සමාගමකට උප-කොන්ත්‍රාත් දී තිබෙනවා''යැයි ඔහු පැවසී ය.

ආන්ඩුවේ ක්‍රියාව පුදුමයට කරුනක් නො වේ යයි තවත් කාන්තා කම්කරුවෙක් ප්‍රකාශ කර සිටියා ය. ''කම්කරුවන් ගනනාවක් ඝාතනය කරමින් හා තුවාල කරමින් ඇන්සල් ලංකා කම්කරුවන්ට 1995 දී වෙඩි තැබුවේ මේ ජනාධිපතිනිය යටතේ සිටි පොලීසිය ම යි.'' ඇය කීවා ය. 1994 දී බලයට පැමින මාස ගනනාවක් ඇතුලතදී ම, ජනාධිපති කුමාරතුංග හා ඇයගේ ඉහත පොදු පෙරමුනු ආන්ඩුව වර්ජනය කර සිටි ඇන්සල් ලංකා කම්කරුවන්ට එරෙහිව ආයුධ සන්නද්ධ පොලීසිය යෙදවී ය. එක් කම්කරුවෙකු වෙඩි තබා මරා දැමිනි.

''ඉහත එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව හා මෙය අතර වෙනසක් නැතැ''යි ඇය ප්‍රකාශ කලා ය. ''දෙකම ක්‍රියාත්මක වන්නේ කම්කරු විරෝධී වැඩ පිලිවෙලකයි. බාටා පරිපාලනය සේවකයින් ඉවත් කිරීමේ සැලසුම ඉදිරිපත් කලේ එජාපෙ ආන්ඩුව යටතේ දී වූ අතර දැන් එය ක්‍රියාත්මක වෙන්නේ එජනිසය ආන්ඩුව කාලයේ දී යි. අප සටන් වදින්නේ සේවයෙන් පහ කල කම්කරුවන් 595 යලි සේවයේ පිහිටුවීමට මිස වන්දි මුදලක් ලබා ගැනීමේ සම්මුතියකට නොවෙයි.''

කම්කරුවන් වාඩි ලා ගැනීම ඇරඹුවේ ජූනි 22 දා ය. 50,000 ක් පමන සේවක පිරිසක් සහිතව රටවල් 68ක ක්‍රියාත්මක වන කැනේඩියානු පදනමක් සහිත මව් සමාගම විසින් ලංකාවේ බාටා පාවහන් සමාගම ස්ථාපිත කරනු ලැබුවේ 1950 ගනන්වල දී ය.

නිෂ්පාදනය තනි තනි නිවාසයන් තුලට කොන්ත්‍රාත් ක්‍රමයට පිට කරමින් හා චීනය වැනි රටවලින් ලාභදායී ලෙස කරන ආනයනයන් ඉහල දමමින් ලංකාව තුල නිෂ්පාදනය කප්පාදු කිරීමට බාටා සමාගම උත්සාහ දරයි.

අරගලය ඇදී ගිය කාල පරිච්ඡේදය තුල දී බාටා කම්හලේ වෘත්තීය සමිතිය අනුයුක්ත වී සිටින වානිජ හා කාර්මික සේවක සංගමය වාඩි ලා සිටින කම්කරුවන් හුදකලාවට භාජන කලේ ය. කම්කරු පන්තියේ අනෙක් කොටස්වල සහයෝගය බලමුලු ගන්වනු වෙනුවට, වාකාසේසයේ නායකත්වය වන නව සමසමාජ පක්ෂය කලේ බාටා කම්කරුවන්ට ආන්ඩුවේ සහාය ලබා ගත හැකි ය යන මිථ්‍යාව වගා දිගා කිරීම ය.

එක් අවස්ථාවකදී අගමැති මහින්ද රාජපක්ෂ පවා සාකච්ඡාව සඳහා හවුල් කර ගත්ත ද කිසිවක් විසඳුනේ නැත. සාකච්ඡා තව දුරටත් ඉදිරියට යා ගත නොහැකිව සිරවූ කල බාටා පාවහන් වර්ජනය කිරීමේ උද්ඝෝෂනයක් වාකාසේස විසින් දියත් කෙරුන ද දිවයින තුල හෝ ජාත්‍යන්තර කම්කරුවන්ට කාර්මික ක්‍රියාවන්ට එලඹෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් නොකෙරිනි.

අගහරුවාදා පොලිස් මෙහෙයුමට ටික වෙලාවකට පෙර උසාවි නියෝගය පිලිගෙන කම්හලෙන් ඉවත් වීම පිලිගත යුතු යැයි ඒත්තු ගැන්වීමට වාකාසේස නායකයන් උත්සාහයක යෙදිනි. බ්‍රහස්පතින්දා පැවති මාධ්‍ය හමුවකදී, සාකච්ඡාවන් දැන් යොමු වී ඇත්තේ වඩා හොඳ වන්දියක් සඳහා යැයි ප්‍රකාශ කරමින් වාකාසේසයේ නියෝජිතයින් සේවකයින් පහ කිරීම සාරාර්ථ වසයෙන් පිලිගත්තේ ය.

බාටා කම්කරුවන්ට සහාය දීම වෙනුවට, එජනිසය ආන්ඩුව උත්සාහ දැරුවේ විදේශ ආයෝජකයින් සැනසීම සඳහා හැකි ඉක්මනින් වාඩි ලා ගැනීම බිඳ හෙලීම ට යි. අගහරුවාදා දැවැන්ත පොලිස් මෙහෙයුමේ අවශ්‍යතාව වන්නේ සරලව බාටා සේවකයින්ට ප්‍රහාරයක් එල්ල කිරීම නොව රැකියා, වැටුප් හා කොන්දේසි පිලිබඳව වැඩෙන නොසන්සුන්තාවක තතු යටතේ මත සමස්තයක් වසයෙන් කම්කරු පන්තිය ම මෙල්ල කර ගැනීම යි.

© www.wsws.org